පරිසර අමාත්‍යාංශය
"සම්පත්පාය" අංක 82,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.
2006.05. 17

අමාත්‍යාංශ චක්‍රලේඛ අංක - 02/2006

වන සංරක්ෂක
සියලුම දිස්ත්‍රික් ලේකම්වරු
සියලුම ප්‍රාදේශීය ලේකම්වරු

**අවශේෂ කැලෑ වශයෙන් වන සංරක්ෂක වෙත පැවරී ඇති ඉඩම් වලින් කැලෑ නොමැති ඉඩම් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පැවරීම**

රජයට අයත් සියලුම අවශේෂ කැලෑ කළමනාකරණය හා පාලනය කිරීම සඳහා වන සංරක්ෂකට පැවරීම යන මැයෙන් වන සම්පත් හා පරිසර අමාත්‍යාංශය විසින් නිකුත්කල 2001.08.10 දිනැති අංක 5/2001 චක්‍රලේඛය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

ඉහත 5/2001 චක්‍රලේඛය මගින් කැලෑ කිසිවක් නොපවතින ඉඩම් ද වන සංරක්ෂක වෙත පැවරීම නිසා රජයේ කඩිනම් සංවර්ධන අවශ්‍යතාවන් සඳහා අත්‍යවශ්‍ය ඉඩම් පවා මෙම කාර්යයන් සඳහා නිදහස් කිරීමට ඇතිවන ප්‍රමාදයන් වැලැක්වීම සඳහා මෙම සංශෝධන හඳුන්වා දෙනු ලැබේ.

**සංශෝධන**

5/2001 චක්‍රලේඛයේ 03 වන ඡේදයට ඉහික්බිතිව පහත සඳහන් ඡේදය එකතු කිරීමෙන් :

"එසේ වුවද කැලෑ වශයෙන් නොපවත්නා ඉඩම් නැවත ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත නිදහස් කිරීම පිණිස පහත සඳහන් පරිදි කටයුතු කල යුතුය.

3.1 දිස්ත්‍රික් ලේකම්/ දිසාපති විසින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අඩවි වන නිලධාරී, ඉඩම් නිලධාරී හා ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීගෙන් සමන්විත දිස්ත්‍රික් මට්ටමේ කමිටුවක් මෙම කැලෑ නොමැති ඉඩම් හඳුනා ගැනීම සඳහා පත් කල යුතුය. අවශ්‍ය අවස්ථාවන්හිදී පුරා විද්‍යා දෙපාර්තමේන්තුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වැනි ආයතනවල නිලධාරීන්ද කමිටුවට ඇතුලත් කල යුතුය.

3.2 මෙම ඉඩම් හඳුනා ගැනීම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සිදු කල යුතු හෙයින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමේ සිටින ඉඩම් නිලධාරී හා අනෙකුත් නිලධාරීන්ගේ සහාය මේ සඳහා ලබාගත යුතුය. ප්‍රාදේශීය ලේකම් තම බල ප්‍රදේශයේ මෙසේ නිදහස් කිරීමට යෝජිත ඉඩම් සම්බන්ධ නිර්දේශය ඉහත (1) හි සඳහන් කමිටුව වෙත ඉදිරිපත් කල යුතු නිසාත්, මෙම කටයුතු බාධාවකින් තොරව සිදුවීම පිණිසත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමේ නිලධාරීන් අනු කමිටුවක් ලෙස යොදා ගැනීම සුදුසුය. ඉඩම් හඳුනා ගැනීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සහායද ලබාගත යුතුය.

මෙසේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහා හඳුනාගනු ලබන ඉඩම් මායිම් සහිතව මේ සමග අමුණා ඇති ආකෘතියේ ආකාරයට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලේඛණගත කොට අන්තර් අමාත්‍යාංශ කමිටුවට ඉදිරිපත් කිරීම පිණිස මා වෙත එවිය යුතුය. එසේ නිදහස් කිරීමට යෝජිත ඉඩම් සඳහා දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුවේ අනුමැතිය පළමුවෙන් ලබාගත යුතුය. අන්තර් අමාත්‍යාංශ කමිටුව මගින් මෙම ඉල්ලීම සැලකා බලා සුදුසු ඉඩම් නිදහස් කිරීමට කටයුතු කරනු ඇත. ඉදිරියේදී සමාජ ජන විද්‍යා, ජන ව්‍යාපෘති හා ජනාන්තර සංවර්ධනය කටයුතු සඳහා යෝජිත හෝ දැනටමත් එවැනි සංවර්ධන සැලසුම්වලට ඇතුලත් කර ඇති ඉඩම්ද ආනතිය අංශක 30 ට වැඩි බෑවුම් සහිත ඉඩම් ද, පාරිසරික වශයෙන් සංවේදී යැයි කමිටුව මගින් හඳුනාගනු ලබන ඉඩම්ද මෙම ගණයට ඇතුලත් නොකළ යුතුය. "

ජේ.ආර්.ඩබ්. දිසානායක
ලේකම්

පිටපත් -

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. ලේකම්,
   රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

} දැන ගැනීම සඳහා